පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 222

ආයතනයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභා ගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 222
நிறுவனத்தின் பெயர்: தொல்லியல் திணைக்களம்
பாராளுமன்றத்தின் அரயச கணக்குக் குழுவினால் முன்வைக்கப்ட்ட அறிக்கை
தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப்
பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக
எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliamentary Series No: 222Name of the Institution: Department of Archaeology

Submission of observations of Hon. Minster in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee in public Accounts in terms of Standing Order No. 119 (4)

| **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.)/ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්.<br>කාරක සභාවේ නිරීක්ෂණ/නිර්දේශ** |
|---|---|
| 01. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩුව පැවතීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. එහි දී, සහකාර අධ්‍යක්ෂ තනතුරු 27ක් සඳහා 2016 වසරේ දී බඳවාගැනීමේ පටිපාටි සකස් කර අනුමත කළ ද එම තනතුරු අනුමත කළ දිනයේ සිටම පුරප්පාඩුව පවතින බව කාරක සභාව හමුවේ අනාවරණය විය. | විධායක සේවා ගණය සඳහා වන (SL-1) බඳවා ගැනීමේ පටිපාටිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC(FR) 248/2016 දරණ නඩුකරය නිසා බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකිව මෙම තනතුරු පුරප්පාඩු වී පවතී. එහි අවසන් තීන්දුව 2024.07.17 දිනැතිව නිකුත් කර ඇති අතර, පුරප්පාඩු පිරවීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබා දී ඇති බව අග්‍රාමාත්‍ය කාර්යාලයේ අංක PMO/RRPCM/2025/decision හා 2025.04.02 දිනැති ලිපියෙන් දන්වා ඇත.<br>ඒ අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදන සකසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යොමු කර ඇත. එමෙන්ම සීමිත හා විවෘත පදනමින් තරඟ විභාග පැවැත්වීම සඳහා අදාළ කටයුතු සිදු කිරීමට SLIDA ආයතනය සමඟ සම්බන්ධීකරණය වී අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 02. <u>**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර පුරප්පාඩු වී තිබීම.**</u> | බඳවාගැනීම් සිදු කිරීමට අදාළ කැඳවීම් නිවේදනය 2024.12.27 දින ගැසට් පත්‍රයේ පළකර අයදුම්පත් කැඳවා 2025.04.25 දින සම්මුඛ පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.<br><br>ඒ අනුව 2025.08.11 දිනැතිව ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම තනතුරට නිලධාරිණියක පත්කර ඇති නමුත් එම පත්වීම භාරගෙන නැත. මීළඟ අයදුම්කරු පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇතත් අනුමැතිය ලැබී නොමැත. ඒ අනුව වැඩ බැලීමේ පදනම මත බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරියෙකු පත්කර ඇත. |

| | |
|---|---|
| **03. <u>පුරාවස්තු ගැසට් කිරීම සහ ආරක්ෂා කිරීම.</u>** | <u>ගැසට් කිරීම</u><br>• පුරාවස්තු ගැසට් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා සෑම මසකම සෑම දිස්ත්‍රික්කයකට ම අදාළව ස්මාරක 20ක් හා රක්ෂිත 2ක් බැගින් තොරතුරු ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ගෙන්වා ගෙන ගැසට් කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.<br>• ඒ අනුව දිවයින පුරා රක්ෂිත 139ක් මේ වන විට ප්‍රකාශයට පත්කර ඇති අතර රක්ෂිත ගැසට් කිරීමේ ක්‍රියාවලියට නව ස්ථාන 117ක් ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයේ දී රක්ෂිත 07ක් ප්‍රකාශයට පත්කර ඇති අතර 2024.12.31 දින වන විට ස්මාරක 2960ක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත.<br>• මෙතෙක් ප්‍රකාශයට පත්කර ඇති පුරාවිද්‍යා රක්ෂිතවල විස්තර පහත වගුවල දැක්වේ. |

ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත භූමි ප්‍රමාණය

| අනු අංකය | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුරාධපුරය | 29 |
| 02 | පොළොන්නරුව | 10 |
| 03 | කෑගල්ල | 09 |
| 04 | රත්නපුර | 07 |
| 05 | වවුනියාව | 01 |
| 06 | මුලතිවු | 02 |
| 07 | යාපනය | 04 |
| 08 | මොණරාගල | 07 |
| 09 | බදුල්ල | 01 |
| 10 | කොළඹ | 02 |
| 11 | කළුතර | 01 |
| 12 | අම්පාර | 04 |
| 13 | ත්‍රිකුණාමලය | 12 |
| 14 | පුත්තලම | 03 |
| 15 | කුරුණෑගල | 18 |
| 16 | මාතලේ | 14 |
| 17 | මහනුවර | 07 |
| 18 | මාතර | 03 |
| 19 | හම්බන්තොට | 05 |
| | **එකතුව** | **139** |

| | |
|---|---|
| | ප්‍රකාශයට පත්කර ඇති ස්මාරක ප්‍රමාණය |

| අනු අංකය | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුරාධපුරය | 183 |
| 02 | පොළොන්නරුව | 102 |
| 03 | කුරුණෑගල | 314 |
| 04 | පුත්තලම | 42 |
| 05 | මහනුවර | 323 |
| 06 | මාතලේ | 60 |
| 07 | නුවරඑළිය | 86 |
| 08 | කෑගල්ල | 197 |
| 09 | රත්නපුර | 136 |
| 10 | බදුල්ල | 145 |
| 11 | මොණරාගල | 137 |
| 12 | අම්පාර | 354 |
| 13 | ත්‍රිකුණාමලය | 37 |
| 14 | මඩකලපුව | 03 |
| 15 | ගාල්ල | 95 |
| 16 | මාතර | 84 |
| 17 | හම්බන්තොට | 83 |
| 18 | ගම්පහ | 185 |
| 19 | කළුතර | 64 |
| 20 | කොළඹ | 109 |
| 21 | යාපනය | 63 |
| 22 | වවුනියාව | 29 |
| 23 | මන්නාරම | 33 |
| 24 | කිලිනොච්චිය | 08 |
| 25 | මුලතිව් | 88 |
| | **එකතුව** | **2960** |

ස්මාරක හා රක්ෂිත ගැසට් කිරීම් ක්‍රමවේදය (ඇමුණුම 01) මගින් දක්වා ඇත.

<u>ආරක්ෂා කිරීම</u>

- දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් 2024.06.11 දින සිට 2024.07.25 දක්වා කාලවකවානුව තුළ පුරාවස්තු ආරක්ෂණ කමිටු පිහිටුවීම සිදුකර ඇත. නමුත් ජනවාර්ගික ගැටළු ආදී හේතු මුල් කරගෙන උතුරු නැගෙනහිර ප්‍රදේශවල ස්ථාන 04කට අදාළව කමිටු පිහිටුවීමේ ගැටළු මතු වී ඇත. කෙසේ වුව ද ඉදිරියේ දී එම ස්ථාන හතරෙහි ද කමිටු පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.

| | |
|---|---|
| | මේවන විට ප්‍රාදේශීය ආරක්ෂණ කමිටු 70කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇත.<br>එසේම 2025 ජනවාරි මාසයේ සිට දෙපාර්තමේන්තු ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී පුරාවස්තු ආරක්ෂණ කමිටුවල ප්‍රගතිය හා ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමට නියමිතය.<br>• ඇතැම් ස්ථාන සඳහා මේ වන විට සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් යොදවා ඇත.<br><br>• ඇතැම් ස්ථාන පුරාවිද්‍යා වැඩබිම් ලෙස නඩත්තු වන අතර මුරකරුවන් යොදවා ඇති ස්ථාන ද වේ.<br><br>• කලාප භාර නිලධාරී යටතේ ද මෙම ස්ථාන අධීක්ෂණය වන අතර දැනට ගැසට් කර ඇති සෑම ස්මාරකයක් වෙනුවෙන්ම ආරක්ෂා කිරීමේ ඉහත ක්‍රම ආදේශ කල නොහැකිය. එනම් ඇතැම් ස්මාරක ස්ථාන වලට ළඟාවීම සඳහා මාර්ග පද්ධතියක් හෝ නොමැති වනාන්තර ස්මාරක තුල ද පවතින බැවිනි.<br><br>• පෞද්ගලික සන්තක ඉඩම්වල පවතින ස්මාරක ගැසට් කළ පසුව කාර්යපරිපාටි මඟින් හඳුන්වා දී ඇති ග.ලේ 16 ආකෘති පත්‍රය යටතේ සෑම හිමිකරුවෙක්ම දැනුවත් කරනු ලබන අතර එම ස්මාරක සම්බන්ධයෙන්ම කටයුතු කල යුතු ආකාරය එහි දී (නීතිමය තත්ත්වය) දැනුවත් කරනු ලබයි.<br><br>• පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතන, පාසල් දැනුවත්කිරීම මේ වන විටත් ප්‍රාදේශීය කාර්යාල යටතේ සිදුකරනු ලබන අතර 2026 වර්ෂයේ සිට ප්‍රදේශවාසීන් ද දැනුවත් කිරීම සඳහා එම වැඩසටහන් ග්‍රාමීය මට්ටමට පුළුල් කිරීමට සැලසුම් කර ඇත. |

| | |
|---|---|
| **04.** <u>**රට තුළ තිබෙන පුරවිද්‍යා ස්ථාන සිතියම්ගත කිරීම සහ ඒවා වෙබ් අඩවියට ඇතුළත් කිරීම.**</u> | මේ වන විට පුරාවිද්‍යා ස්ථාන 6536ක් හඳුනාගෙන ඇති අතර ඒ අතුරින් ස්ථාන 2723 ක් පිළිබඳ විස්තර වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. වෙබ් අඩවියට ඇතුළත් කර නොමැති ස්ථාන 3813ක විස්තර වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති අතර එය **(ඇමුණුම 02)** යටතේ දක්වා ඇත. මෙම කාර්යය සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දැනුම ප්‍රමාණවත් වේ.<br><br>GIS බණ්ඩාංක ලබාගැනීමට අවශ්‍ය GPS යන්ත්‍ර දෙපාර්තමේන්තුව තුළ නොතිබුණු අතර එම යන්ත්‍ර මිලදී ගැනීමට හා නිලධාරීන්ට අවශ්‍ය GIS පුහුණුව ලබාදීම 2024 වර්ෂයේ දී සිදුවිය. 2024 වර්ෂය තුළ බණ්ඩාංක වෙබ් අඩවියට ඇතුළත් කිරීමේ දී ගැටළු ලෙස එම හේතු බලපා තිබුණි. නමුත් 2025 වර්ෂයේ සිට එය ක්‍රියාත්මක කිරීම සඳහා සෑම පලාතකට ම එක් GPS යන්ත්‍රයක් බැගින් මේ වන විට ලබා දී ඇත. |
| <u>05.සාගර පුරාවස්තු සිතියම් ගත කිරීම.</u> | ශ්‍රී ලංකාවේ ගිලුණු නෞකා පිළිබඳ ජාතික දත්ත ගබඩාව හෙවත් National Shipwreck Database of Sri Lanka වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. (https.//nsd.ccf.gov.lk) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය විසින් මෙම දත්ත ගබඩාව පවත්වා ගෙන යනු ලබන අතර ගවේෂණ මගින් සොයා ගන්නා ගිලුණු නෞකා සහ ජලාශ්‍රිත පුරාවිද්‍යා තොරතුරු මෙයට අඛණ්ඩව ඇතුළු කර යාවත්කාලීන කරනු ලබයි. |
| **06.** <u>**සාගර පුරාවස්තු ගැසට් කිරීම.**</u> | • සාගර පුරාවස්තුවනුයේ බොහෝවිට සාගරයේ ගිලී ඇති නෞකා සහ ගුවන් යානා වේ. මෙවැනි පුරාවස්තු සඳහා නිර්මාණය අයත් රටට සහ ගිලී ඇති මුහුදු සීමාව අයත් රටට යන දෙකටම අයිතිවාසිකම් කිව හැකිය. එවැනි අවස්ථාවල නීතිය ක්‍රියාත්මක කළ නොහැකිවීම හේතුවෙන් මෙම සාගර පුරාවස්තු අධ්‍යයනයකර වාර්තාගත කිරීම පමණක් සිදුකරනු ලබන අතර ගැසට් කිරීමක් සිදුකිරීම නොකරනු ලැබේ. නමුත් පුරාවස්තු ආඥා පනත, ආරක්ෂක නීති රීති ඇතුළු දේශීය නීති හා විදේශීය නීති මගින් මෙම පුරාවස්තු ආරක්ෂා වේ. |

- එමෙන්ම පුරාවස්තු ආඥා පනත අනුව සාගර පුරාවස්තු ගැසට් කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බව ද පෙන්වා දිය යුතු ය.

- ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව ( සාගර) වටා ගිලී ගිය නාවික යාත්‍රා 113ක් පමණ මේ වනවිට සමුද්‍රීය ගවේෂණ මගින් හඳුනාගෙන ඇත. එම යාත්‍රා ක්‍රි.පූ. 02 වන සියවසේ සිට 19 වන සියවසෙහි අග භාගය දක්වා වූ කාලයට අයත් වේ. නමුත් එම ස්ථාන මේ වන තෙක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර නොතිබුණ ද පහත සඳහන් ජාත්‍යන්තර / ජාතික අණපනත් හා ප්‍රඥප්ති මගින් එම ස්ථානවල නෛතික ආරක්ෂා තහවුරු වී ඇති බව නිරීක්ෂණය වේත ඒවා නම්

i. 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන) ආඥාපනතේ 02 න වගන්තියේ 03 වන උපවගන්තිය.

ii. එක්සත් ජාතීන්ගේ සමුද්‍රීය නීතිය (UNCLOS – III (1982) මගින් ලංකාවට අයත් මුහුදු සීමාවේ ගිලී ඇති නාවික සුන්බුන් හා බලපැවැත්වෙයි.

iii. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරණ සමුද්‍රීය කලාප නීතිය යටතේ කරන ලද ප්‍රකාශන මගින් ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශය අයත්වෙයි.

iv. යුනෙස්කෝ සම්මුතියට අනුව මුහුදු පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ කර ඇති ප්‍රකාශය.

v. ජලාශ්‍රිත සංස්කෘතික උරුම ආරක්ෂණ යුනෙස්කෝ ප්‍රඥප්තිය (2001) (දැනට ලංකාව තුළ ස්ථාපනය කර නොමැති වුව ද එම ප්‍රඥප්තියේ නිරීක්ෂණ අනුව ක්‍රියා කිරීම.

vi. සංස්කෘතික දේපල පනත ( 1981)

vii. වෙරළ ආරක්ෂණ පනත (1981)

viii. පොදුරාජ්‍ය මණ්ඩලීය War Grave පනත දෙවන ලෝක යුධ සමයේ අනතුරට පත් නාවික යාත්‍රා හා ගුවන් යානා සම්බන්ධව ක්‍රියා කිරීම.

| | |
|---|---|
| | ix. අන්තර් අමාත්‍යාංශ කමිටුව මගින් පනවා ඇති අමාත්‍ය මණ්ඩල තීරණ.<br><br>x. නාරා ආයතනයේ පනත.<br><br>xi. ජාතික ආරක්ෂණ පනත.<br><br>xii. වනජීවී ආරක්ෂණ පනත (සාගර)<br><br>මේ අනුව ඉහත සඳහන් ජාතික හා ජාත්‍යන්තර අණපනත් මගින් ලංකාවේ රාජ්‍යයට අයත් මුහුදු සීමාව තුළ මුහුදු පත්ලේ හා වෙරළ ආශ්‍රිතව ස්ථානගත වී ඇති ජලාශ්‍රිත පුරාවිද්‍යා ස්ථාන නෛතිකව ආරක්ෂා වීමේ ප්‍රතිපාදන සඳහන් වී ඇත. |
| 07. <u>වෙබ් අඩවියට ඇතුළත් කර ඇති සාගර පුරාවිද්‍යා ස්ථාන සඳහා ප්‍රවේශ මාර්ග සඳහන් කිරීම.</u> | මේ සඳහා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සහයෝගය ඇති ව සිදු කළ යුතු කාර්යයකි. ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමේ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. |
| **09 <u>පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම.</u>** | පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ කාර්යයට අදාළව සකස්කර ඇති කාර්යය නිර්ණය අනුදේශ අදාළ TOR 2025.02.24 දින අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. තව ද මෙම ජාතික ප්‍රතිපත්තිය සංශෝධන කාර්යය සඳහා මීට පෙර අමාත්‍යාංශ මට්ටමින් පත්කර තිබූ කමිටු සාමාජිකයින් වෙනුවට දස දෙනෙකුගෙන් යුත් නව කමිටුවක් නිර්දේශකර 2025.01.27 දිනැතිව අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br>• අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශය 2025.10.17 දින අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. |

| | |
|---|---|
| 10. කිමිදුම් රක්ෂණාවරණයක් ලබා දීම. | මේ වන විට ලංකාවේ කිසිදු රක්ෂණ සමාගමක් මගින් කිමිදුම් රක්ෂණාවරණයක් ලබා දෙනු නො ලැබේ. කිමිදුම් රක්ෂණාවරණයක් නිර්මාණය කිරීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකයේ සේවය කරණ කිමිදුම් නිලධාරීන්ට අවශ්‍ය කිමිදුම් රක්ෂණාවරණයක් සකස් කිරීමේ මූලික කටයුතු මේ වන විට අවසන් ව පවතී. එලෙස තෝරා ගනු ලබන කිමිදුම් රක්ෂණාවරණය පිළිබඳ තොරතුරු හැකි ඉක්මනින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් රජයේ ආයතනවලට ද ලබාගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **11.** තීන්දු තීරණවලට එළඹීමේ දී පුරාවිද්‍යා උපදේශක සභාව හා අනෙකුත් පුරාවිද්‍යාව හා සම්බන්ධ ආයතනවල පිහිටුවා ඇති අදාළ සභා/කමිටු අතර නිසි සම්බන්ධීරණයක් ඇති කර ගැනීමට ඒකාබද්ධ යාන්ත්‍රණයක් නොමැති වීම පිළිබඳව 2023.05.24 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානය යොමුකළ අතර එම කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නිර්දේශ සම්බන්ධයෙන් කාරක සභාව විසින් කරුණු විමසන ලදී. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ,ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වැනි පුරාවිද්‍යාව හා සම්බන්ධ ආයතනයන්හි මේ වන විට සභා/කමිටු ක්‍රියාත්මක වේ.මේවා ආයතන ප්‍රධානියා විසින් සිය කාර්යය කිරීම සම්බන්ධයෙන් උපදෙස් අපේක්ෂා කළ විටෙක ,උපදෙස් ලබා දීම සඳහා පිහිටුවන ලද උපදේශක සභා/කමිටු වේ. එම සභා/කමිටු ඒකාබද්ධ යාන්ත්‍රණයක් තුළට ගෙන ,පුරාවිද්‍යා දත්ත ,තොරතුරු සම්බන්ධව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මේ වන විට අමාත්‍යාංශය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. |
| **12. <u>නිර්දේශිත ලෝක උරුමයන් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම.</u>** | • ලෝක උරුම ස්ථානයන් නම් කිරීමේ දී වසරකට නම් කළ හැක්කේ එක් ස්ථානයක් පමණකි. අනෙකුත් ස්ථාන සම්බන්ධයෙන් අධ්‍යයනය කර, යෝජනා ඉදිරිපත් කිරීමට හැකි අතර ඒ සඳහා කමිටුවක් පත්කර ඇත. එම කමිටුව යෝජනා ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබේ.<br><br>• තාවකාලික ලැයිස්තුවට (Tentative List) ඇතුළත් කර ඇති යෝජනාව පරීක්ෂා කිරීමට සාමාජිකයන් 22 ගෙන් සමන්විත කමිටුවක් ඇති අතර යුනෙස්කෝව, IUCN / ICOMOS ආයතන වෙතින්, ඉදිරිපත් කරනු ලබන එම යෝජනාව සළකා බලනු ලැබේ. |

| | |
|---|---|
| | • එම කමිටුව විසින් සංස්කෘතික උරුම සඳහා නිර්ණෘයක 06ක් යටතේ කරුණු සළකා බලන අතර, ස්වාභාවික උරුම යටතේ නිර්ණායක 04ක් සළකා බලනු ලැබේ. එම නිර්ණායක එකක් හෝ කිහිපයක් ඇතුළත් වන්නේ ද යන්න ඇගයීමට ලක් කිරීම සිදු කරයි.<br><br>• අදාළ විශේෂඥ කමිටුව විසින් එම නිර්ණායකයන් ගැළපෙන බවට ඇගයීම් සිදුකර, එයට පුළුල් සාකච්ඡාවක් සිදුකර එකඟ වන්නේ නම්, සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත ලෝක උරුම කමිටුවට යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.<br><br>• එම කමිටුව විසින් එය ලෝක උරුමයක් ලෙසට ඇතුළත් කිරීමේ දී, ලෝක උරුමයක් ලෙස නම් කිරීමට සුදුසු බව ලැයිස්තුවට ඇතුළත් කිරීමට අඩුපාඩු තිබේ නම්, අඩුපාඩු පෙන්වා දීම, කල් දැමීම, ප්‍රතික්ෂේප කිරීම සිදුකරනු ලැබේ. මෙම ක්‍රියාදාමය දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ පාලනයෙන් බැහැරව සිදුකරන දීර්ඝ කටයුත්තක් බැවින් ඒ සඳහා මැදිහත්වීමට ක්‍රමවේදයක් නොමැත.<br><br>• ලෝක උරුම කමිටුව විසින් ලැයිස්තුවට ඇතුළත් කරන්නේ නම් ඉන්පසුව එම ලෝක උරුමය පිළිබඳ තොරතුරු සාමාජික රටවල් 196 තුළ දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>• ස්වාභාවික ලෝක උරුමයන් පරිසර විෂයය භාර අමාත්‍යාංශය යටතේ ඇති යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව මගින් ලෝක උරුම මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලබයි.<br><br>• මෙම ලෝක උරුම ස්ථාන සඳහා නාම යෝජනා සකස් කිරීම විවිධ පාර්ශවයන් මගින් සිදුකළ හැකි අතර අදාළ නිර්ණායක අනුව සකස් කරනු ලබන යෝජනා ඉහත දක්වා ඇති ක්‍රමවේදය ඔස්සේ ලෝක උරුම කමිටුවේ අනුමැතිය සඳහා යවනු ලැබේ. |

- එම යෝජනා ICOMOS, IUCN සහ ICCROM යන ආයතනයන්ගේ නිර්දේශ පරිදි ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කරනු ලැබේ.

- තවද ශ්‍රී ලංකාවේ දැනට පවතින ලෝක උරුම ස්ථානයන්ට අමතරව තවත් ලෝක උරුම ස්ථානයන් නම් කළ යුතු බවට ඇති යෝජනා අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් එම කාර්යය සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සඳහා ආචාර්ය ගාමිණී විජේසූරිය මහතා පත්කරන ලදී. ඒ අනුව එම කරුණු සම්බන්ධව රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර, ලෝක උරුම ස්ථාන ලෙස යෝජනා කළ යුතු ස්ථාන පහත සඳහන් ලෙස හඳුනාගෙන තිබේ.

i. අනුරාධපුර පූජනීය නගරයේ දිගුවක් ලෙස මිහින්තලය ආශ්‍රිත ලෝක උරුමය.

ii. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය.

iii. ශ්‍රී ලංකාවේ බෞද්ධ භාවනාරාම ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක උරුමය.

iv. තේ වගාව ආශ්‍රිත කර්මාන්ත උරුමය හා භූ දර්ශනය.

v. දකුණු පළාතේ බිතු සිතුවම් සහිත විහාරස්ථාන.

vi. ජෙෆ්රි බාවාගේ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ.

vii. මධ්‍යතන යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණ

viii. Oratorian Churched of Sri Lanka

ඉහත ක්ෂේත්‍ර ලෝක උරුම ස්ථාන ලෙස නම් කිරීමට කටයුතු සිදුකරගෙන යන අතර මේවා අතරින් "ශ්‍රී ලංකාවේ බෞද්ධ භාවනාරාම ආශ්‍රිත වාස්තුවිද්‍යාත්මක උරුමය යටතේ අරන්කැලේ, මානාකන්ද, රිටිගල සහ නාගොල්ල යන ස්ථාන මේ වන විට තාවකාලික ලැයිස්තුවට (Tentative List) ඇතුළත් කර අවශ්‍ය කටයුතු සිදුකර තිබේ.

| | |
|---|---|
| | • ශ්‍රී ලංකාවේ මේ වන විට සංස්කෘතික ලෝක උරුමයන් හයක් ස්වභාවික ලෝක උරුමයන් දෙකක් නම් කර ඇති අතර ස්ථාන පහක් පොරොත්තු ලැයිස්තුවට ඇතුලත් කර ඇත.<br><br>*** සංස්කෘතික ලෝක උරුම**<br>i. අනුරාධපුර පූජනීය නගරය<br>ii. පොළොන්නරුව පැරණි නගරය<br>iii. සීගිරිය පැරණි නගරය<br>iv. ගාල්ල පැරණි නගරය සහ එහි කොටු පවුර<br>v. රංගිරි දඹුලු විහාරය<br><br>*** ස්වාභාවික ලෝක උරුම**<br>i. සිංහරාජ වනාන්තරය<br>ii. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරය (සිරිපා<br>iii. අඩවිය/ හෝර්ටන් තැන්න/ නකල්ස් කඳු පංතිය)<br><br>*** පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇති නාමයෝජනා**<br>i. සේරුවිල මංගල රජමහා විහාරය<br>ii. මහවැලි ගඟ දිගේ ඇති සේරුවිල සිට ශ්‍රී<br>iii. පාදස්ථානය දක්වා ඇති වන්දනා මාර්ගය<br>iv. රජගල පුරාවිද්‍යා රක්ෂිතයේ ඇති පුරාණ<br>v. ආරියකර විහාරය<br>vi. ශ්‍රී ලංකාවේ තේ ආශ්‍රිත සංස්කෘතික භූ දර්ශනය<br>ලෝක උරුමයන් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කර ඇති ස්ථාන.<br>• ශ්‍රී ලංකාවේ පැරණි බෞද්ධ භාවනාරාම (රිටිගල/අරන්කැලේ/මානාකන්ද) පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇත.<br>• ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ආශ්‍රිත භූ දර්ශනය - පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇත.<br>• මිහින්තලේ (අනුරාධපුරයට දිගුවක් වශයෙන්)<br>• 19වන සියවසේ අග භාගයේ බෞද්ධාගමික සිතුවම් සහිත ස්ථාන<br>• පැරණි වාරිමාර්ග පද්ධතිය<br>• සර්ම කළාපීය නූතන වාස්තු විද්‍යාව<br>• ඔරටෝරියන් පල්ලි |

| | |
|---|---|
| | • මහායාන අභාසය සහිත ආරාමික සංකීර්ණ<br>• ප්‍රාග් ඓතිහාසික ගුහා වාසස්ථාන<br>මේ වන විට ලෝක උරුම පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇති ශ්‍රී ලංකාවේ පැරණි භාවනාරාම යෝජනාවට සම්බන්ධ රිටිගල පුරාවිද්‍යා ස්ථානයෙහි ඇති ස්වභාවික වටිනාකම් අනුව එම අගයන් ද එකතුකර රිටිගල මිශ්‍ර ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමේ යෝජනාවක් පිළිබඳ සාකච්ඡාවක් පසුගිය සතියේ පරිසර අමාත්‍යාංශයේ දී පැවති අතර එම යෝජනාව IUCN ආයතනය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව සකස් කර ඇත. |
| 13. <u>**පුරාවිද්‍යා කැණීම් කටයුතු මෙහෙයවීම/අධීක්ෂණය කිරීම, සංරක්ෂණය හා දත්ත ගබඩා කිරීම.**</u><br>මේ සම්බන්ධයෙන් 2023.05.24 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී කාරක සභාව ලබාදුන් නිර්දේශ සම්බන්ධයෙන් කාරක සභාව විසින් කරුණු විමසන ලදී. | • දෙපාර්තමේන්තුව මගින් හා බලපත්‍ර යටතේ සිදුකරන කැණීම් සම්බන්ධ ලේඛන හා පරිගණක හා දත්ත ගොනු යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ. මේවන විට අලුතින් කැණීම් 120 ක තොරතුරු Excel දත්ත පද්ධතියකට ඇතුළත් කර ඇත. (ඇමුණුම 03)<br><br>• කැණීම්වල දී හඳුනාගන්නා පුරාවස්තු සංරක්ෂණය කර කෞතුකාගාරයකට හෝ වෙනත් ආයතනයකට භාරදෙන්නේ ද යන්න තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක ලේඛනයක් හඳුන්වා දීමට උත්සාහ කළ ද එම පුරාවස්තු ලියාපදිංචි ලේඛනය මුද්‍රණය කිරීම සඳහා දෙවරක් මිල ගණන් කැඳවීම සිදුකළ ද සාධනීය සැලයුම්කරුවකු ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ලේඛනය 2024 වර්ෂයේ මුද්‍රණය කිරීමට නොහැකි විය. ලේඛනයේ වැදගත්කම හේතුවෙන් 2025 වර්ෂයේ ද මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. |

| | |
|---|---|
| **14.** <u>අත්තනගලු පාරුව සංරක්ෂණ කිරීම.</u> | • අත්තනගල්ල පාරුවේ ප්‍රතිෂ්ඨාපන කටයුතු සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ විද්වත් කමිටුව මගින් අදියර 08කින් යුත් සැලැස්මක් ඉදිරිපත්කර ඇති අතර ඉන් අදියර 06 දක්වා වැඩ නිමවා ඇත.<br><br>• පාරුවේ මුළු දිග අඩි 59 අගල් 11ක් වන බැවින් අඩි 20 කොටස් තුනකට පාරුව කොටස්කර එහි මුල් කොටස මැටි මධ්‍යයෙන් නිමකර ඇති අතර එම මුල් කොටස පුරාවිද්‍යා සංරක්ෂණ අංශය විසින් කුටීර නවයකට බෙදා දැනට ශේෂව ඇති භායනයට ලක් නොවූ අරටුව සහිත මුල්කෘතියට ඔබ්බවීමට සැලසුම් කර ඇත. මෙම මුල් අඩි 20 කොටස විද්වත් කමිටුව විසින් නිරීක්ෂණ කිරීමට නියමිතය. තවද මෙම ශේෂව ඇති පැරණි දැව කොටස් තහවුරු කාරකයක් යොදා නැවත ශක්තිමත් කිරීම කළ යුතු බැවින් ඒ සඳහා (Consolidation) සාම්පල් පරීක්ෂාවක් ද පුරාවිද්‍යා සංරක්ෂණ අංශය විසින් සිදු කර ඇත.(ක්‍රියාකාරී සැළැස්ම අමුණා ඇත.) **(ඇමුණුම 04)** |
| **15.** <u>පුරාවිද්‍යා භාණ්ඩවල අනන්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතයට ගැනීම.</u><br>මේ සම්බන්ධයෙන් 2023.05.24 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී කාරක සභාව ලබාදුන් නිර්දේශ ප්‍රකාර වැඩපිළිවෙලක් කාරක සභාව වෙත ලබා නොදීම සම්බන්ධයෙන් කාරක සභාව ප්‍රශ්න කර සිටියේ ය. | පුරාවස්තු සහ පුරාභාණ්ඩවල අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා රසායන සංරක්ෂණ කටයුතුවලදී රසායන සංරක්ෂණ අංශය විවිධ විදේශීය ආයතනවල සහයෝගය ලබා ගන්නා අතර විශේෂයෙන්ම පුරාවිද්‍යා කැණීම් වල දී හමුවන දත්ත කාලනිර්ණය සඳහා කාබන් කාල නිර්ණය, තාප සන්දිප්තතා කාල නිර්ණය සහ OXCAl කාලනිර්ණ ක්‍රම භාවිතා කිරීම ඔස්සේ විදෙස් රටවල සහයෝගය ලබාගනිමින් එම කටයුතු කරමින් පවතින අතර ශ්‍රී ලංකාව තුළ එවැනි රසායනාගාර පහසුකම් නොමැති බව ද පෙන්වා දෙමි. |

| | |
|---|---|
| 16. උතුරු නැගෙනහිර පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම. | 2024.12.31දින වන විට උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කයෙහි ගැසට් කරන ලද ස්මාරක සහ රක්ෂිත පහත පරිදි වේ<br>ප්‍රකාශයට පත්කර ඇති රක්ෂි භූමි ප්‍රමාණය |

| අනු අංකය | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වවුනියාව | 01 |
| 02 | මුලතිවු | 02 |
| 03 | යාපනය | 04 |
| 04 | අම්පාර | 04 |
| 05 | ත්‍රිකුණාමලය | 12 |
| | **එකතුව** | **23** |

ප්‍රකාශයට පත්කර ඇති ස්මාරක ප්‍රමාණය

| අනු අංකය | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අම්පාර | 354 |
| 02 | මඩකලපුව | 03 |
| 03 | යාපනය | 63 |
| 04 | වවුනියාව | 29 |
| 05 | මන්නාරම | 33 |
| 06 | කිලිනොච්චිය | 08 |
| 07 | මුලතිව් | 88 |
| 08 | ත්‍රිකුණාමලය | 37 |
| | **එකතුව** | **615** |

- ප්‍රමුඛතාවය පදනම් කරගෙන උතුරු හා නැගෙනහිර පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කරනු ලැබේ.

උතුරු නැගෙනහිර ජනතාව අතර පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටළුවක් වන්නේ ඒවා සංරක්ෂණය කිරීමෙන් පසු ඔවුන් එම භූමිවලින් ඉවත් කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරන බවට ඇති මතය වේ. එම නිසා එම ස්ථානවල මායිම් කණු දැමීම, ස්ථානීය ගවේෂණය, කැණීම් සිදුකිරීම හෝ අධ්‍යයනය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධවන අවස්ථාවල දී ප්‍රදේශවාසීන් නිලධාරීන්ට අනිසි බලපෑම් පැමිණීම, උද්ඝෝෂණ සිදුකිරීම ඔස්සේ එම කටයුතුවලට බාධා පමුණුවන නිසා එය සිදුකිරීම ප්‍රමාද වී ඇත. නමුත් මෙම කටයුතු සිදුකිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් සහයෝගය ඉල්ලා 2024.05.17 දින සිට ඉල්ලීම් ලිපි යොමු කර ඇත.

.........................................
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)**
**පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්**

.........................................
**ලේකම්,**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.**

ඇමුණුම 01

**ස්මාරක ගැසට් කිරීමේ කාර්ය ක්‍රමවේදය**

- ගවේෂණ ව්‍යාපෘති යටතේ හෝ ස්ථානීය පරීක්ෂා කිරීමේ යටතේ ස්මාරක හඳුනාගැනීම හා වාර්තාගත කිරීම.
- එම ස්මාරක ගැසට් කිරීමට අවශ්‍ය වේනම් ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය සහිතව ප්‍රධාන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) වෙත යොමුකිරීම.
- එම වාර්තා පරීක්ෂාකර විෂයභාර නිලධාරියා යටතේ ගැසට් කිරීමට අවශ්‍ය ස්මාරක ලේඛනය සකස් කිරීම.
- ගැසට් කිරීමට යෝජිත ස්මාරක ලේඛනය සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීම.
- ගැසට් නිවේදන කෙටුම්පත සකස් කිරීම හා පරිඝනකගත කිරීම.
- ඉංග්‍රීසි සහ දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරිම.
- භාෂාත්‍රයෙන් සැකසූ ගැසට් නිවේදන කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතියට යොමුකිරීම.
- එම අනුමැතිය ලද පසුව විෂයභාර අමාත්‍යවරයාගේ අත්සනට යොමුකිරීම.
- එම අත්සන ලද පසුව ආරක්ෂිත ස්මාරක සඳහා පනතේ 19 වගන්තිය ප්‍රකාරව විරෝධතා විමසීම. මෙම නිවේදනය රජයේ මුද්‍රණාලයේ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කරනු ලබයි. විරෝධතා ඉදිරිපත් වී ඇත්නම් විෂයභාර අමාත්‍යතුමා වෙත ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමුකිරීම.
- විරෝධතා නොමැති නම් පනතේ 18 වගන්තිය ප්‍රකාරව නැවත ගැසට් නිවේදන කෙටුම්පත භාෂාත්‍රයෙන් සකසා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය හා විෂයභාර අමාත්‍යවරයාගේ අත්සන ලද පසුව රජයේ මුද්‍රණාලයට යොමුකර ගැසට් පත්‍රය මඟින් ස්මාරක ප්‍රකාශයට පත්කරනු ලබයි.
- පැරණි ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කතිරීමේ දී විරෝධතා විමසීමකින් තොරව පනතේ 16 වගන්තිය ප්‍රකාරව ඉහත සියලු ක්‍රමවේදයන් අනුගමනය කොට රජයේ ගැසට් පත්‍රය මගින් ස්මාරක ප්‍රකාශයට පත්කරනු ලබයි.
- පනතේ 17 වගන්තිය ප්‍රකාරව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත පැරණි වෘක්ෂ ඉහත ක්‍රමවේදයන්ම අනුගමනය කොට පැරණි ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවස්ථාව සලසා දී ඇත.

**ඇමුණුම 02**

## ශ්‍රී ලංකාවේ පුරාස්ථාන ඇතුළත් වෙබ් පෝටලය (GIS අන්තර්ජාල බිහිදොර) යාවත්කාලීන කිරීම සඳහා ක්‍රියාකාරී කාර්ය සැලැස්ම

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ හා ලේඛනගතකිරීම් අංශයෙහි භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය මඟින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පුරාස්ථාන ඇතුළත් වෙබ් පෝටලය (GIS අන්තර්ජාල බිහිදොර) යාවත්කාලීන කිරීම සඳහා වූ කාර්ය සැලසුමයි.

- මෙම වෙබ් පෝටලය තුළ 2017/18 වර්ෂවල සිට 2024 ජූනි මාසය දක්වා පුරා ස්ථාන 1658ක් ඇතුළත්ව තිබූ අතර 2024 ජූලි සිට 2024 දෙසැම්බර් දක්වා කාලය තුළ ඊට පුරාස්ථාන 562ක් ඇතුළත්කොට 2024 වන විට පුරාස්ථාන 2320ක් දක්වා යාවත්කාලීන කර ඇත.

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල මඟින් දැනට හඳුනාගෙන ඇති පුරාස්ථාන ප්‍රමාණයෙහි එකතුව ස්ථාන 6536ක් බවට වාර්තා වී ඇත. ඒ අනුව දැනට වෙබ් පෝටලයට ඇතුළත් කර ඇති පුරාස්ථාන 2723ට අමතරව ඇතුළත් කළ යුතු ඉතිරි පුරාස්ථාන ප්‍රමාණය 3813කි. මෙම පුරාස්ථාන ප්‍රමාණය ඊට ඇතුළත් කොට යාවත්කාලීන කිරීම සඳහා **2025** වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ක්‍රියාකාරී කාර්ය සැලසුම සකසනු ලැබේ.

- මෙම කාර්යය සිදුකිරීම සඳහා පූර්ව නිර්ණායකයක් වශයෙන් මසකට පුරාස්ථාන 100ක ප්‍රමාණයක් යාවත්කාලීන කළ යුතු බවට ඇති සඳහන ප්‍රායෝගික නොවේ. ඊට ප්‍රධාන හේතුව වෙබ් පෝටලය යාවත්කාලින කිරීමට අවශ්‍ය දත්ත සමුදායන් (Databases) සැකසීම සඳහා පුරාස්ථානවල භූ ඛණ්ඩාංක සහ අනෙකුත් විස්තරාත්මක දත්ත (Attributes) සපයා ගැනීමේ ක්‍රියාවලිය පුරාස්ථාන හඳුනාගැනීම, ගවේෂණය හා ලේඛනගතකිරීම ඇතුළු ක්ෂේත්‍ර කාර්යන් හා නිරන්තරයෙන් බැඳී පැවතීමයි. එබැවින් ප්‍රාදේශීය කාර්යාල මඟින් දත්ත ලබාගැනීම හා යාවත්කාලීන කිරීමේ දී ස්ථාන 100ක ප්‍රමාණය ඊට අඩුවීම හෝ වැඩිවීම සිදුවිය හැකිය.

| අංකය | කාර්යය | ප්‍රමාණය | වගකීම භාර නිලධාරීන් | අධීක්ෂණය | කාලය |
|---|---|---|---|---|---|
| 01 | i වෙබ් පෝටලය සඳහා 2025 ජනවාරි මාසය තුළ පුරාස්ථාන ඇතුළත් කොට යාවත්කාලීන කිරීම.<br>ii වෙබ් පෝටලය සඳහා මාසිකව පුරාස්ථාන ඇතුළත් කොට යාවත්කාලීන කිරීම. | 102<br>යෝජිත | ඒකකය භාර නිලධාරි<br>" | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ)<br>" | 2025.02.05 දිනට<br>2025 පෙබරවාරි සිට |
| 02 | i ප්‍රාදේශීය මට්ටමින් එම පළාතේ හෝ දිස්ත්‍රික්කයේ දැනට වාර්තාකර ඇති මුළු පුරාස්ථාන සංඛ්‍යාව හඳුනාගැනීම හා වෙබ් පෝටලයට ඇතුළත්කර නොමැති පුරාස්ථාන වෙන්කර ගැනීම.<br>ii එම පුරාස්ථාන ප්‍රාදේශීය මට්ටමින් ලේඛනයකට ගැනීම.<br>iii ඉහත ලේඛනයට ඇතුළත් වන පුරාස්ථාන අතරින් වෙබ් පෝටලය සඳහා අවැසි භූ ඛණ්ඩාංක සහ විස්තරාත්මක දත්ත සහිත දැනට ප්‍රාදේශීය කාර්යාල සතුව පවතින දත්ත අත්පත්කර ගැනීම. | යෝජිත<br>"<br>" | GIS ඒකකය භාර නිලධාරි ප්‍රාදේශීය කාර්යාලවල GIS විෂය භාර නිලධාරීන් | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ) ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (පළාත්/දිස්ත්‍රික්ක) | 2025 මාර්තු සිට ජූනි |
| 03 | i ඉහත 02 කොටසට අදාළව දත්ත එක්රැස්කර නොමැති පුරාස්ථානයන්හි නව භූ ඛණ්ඩාංක, විස්තරාත්මක දත්ත ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් එක්රැස් කිරීම හා ප්‍රධාන කාර්යාලය වෙත යොමුකිරීම. (ඉහත ස්ථාන 4214 ඇතුළුව අපේක්ෂිත ස්ථාන 4500ක් සඳහා)<br>මෙම දත්ත ක්‍රම 3ක් හරහා යොමුකළ හැකිවේ.<br>a) ඉදිරිපත්කර ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව සකසනු ලබන Shape files (.shp) දත්ත ගොනු මඟින් | මාසිකව 75 බැගින් (යෝජිත)<br>" | ප්‍රාදේශීය කාර්යාලවල GIS විෂය භාර නිලධාරීන් | ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (පළාත්/දිස්ත්‍රික්ක)<br>සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ) | 2025 ජූනි සිට මාසිකව වසර 05ක් සඳහා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | b) ඉදිරිපත්කර ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව සකසනු ලබන MS Exel (.xls) දත්ත ගොනු මඟින්<br>c) ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් සඳහා 2024 ජූලි මස හඳුන්වාදුන් Arc GIS Pro - Survey 1,2,3 නැමැති මෘදුකාංග පෝරමය මඟින්<br>ii එම දත්ත මඟින් වෙබ් පෝටලය යාවත්කාලීන කිරීම | | GIS ඒකකය භාර නිලධාරි | | |
| 04 | i පුරාස්ථානවල ඡායාරූප වෙබ් පෝටලයට ඇතුළත් කිරීම (නව යාවත්කාලීන කිරීමේ දත්ත සඳහා)<br>ii පුරාස්ථානවල ඡායාරූප වෙබ් පෝටලයට ඇතුළත් කිරීම (දැනට ඇතුළත්කර ඇති ස්ථාන 2320ක් සඳහා). මෙම වෙබ් පෝටලය ආරම්භයේ සිටම පුරාස්ථානීය ඡායාරූප ඇතුළත්කර නොමැති අතර ඒ සඳහා ප්‍රාදේශිය කාර්යාල දැනුවත් කොට වැඩපිළිවෙළක් සකසනු ලැබේ. | අපේක්ෂිත<br>" | GIS ඒකකය භාර නිලධාරි ප්‍රාදේශීය කාර්යාලවල GIS විෂය භාර නිලධාරීන්<br>" | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ) ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (පළාත්/දිස්ත්‍රික්ක)<br>" | 2025 පෙබරවාරි සිට<br>" |
| 05 | පුරාස්ථාන නාමයෙහි දෙමළ පරිවර්තන සඳහා යැවීම සහ එම තොරතුරු වෙබ් පෝටලයෙහි යාවත්කාලීන කිරීම. මේ දක්වා යාවත්කාලීන කොට ඇති ස්ථානවල යාවත්කාලීන කිරීම හා නව පුරාස්ථාන සඳහා දෙමළ නාමය යෙදීම. | අපේක්ෂිත | GIS ඒකකය භාර නිලධාරි | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ) | 2025 පෙබරවාරි සිට |
| 06 | GIS ඒකකයේ තාක්ෂණික සම්පත් ප්‍රවර්ධනය කිරීම.<br>a) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කොට ඇති GPS උපකරණ GIS ඒකකය වෙත අත්පත්කර ගැනීම.<br>b) මෙම ඒකකය වෙත Laptop පරිගණකයක් ලබාගැනිම | 14<br>01 | GIS ඒකකය භාර නිලධාරි<br>" | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ)<br>" | 2025 පෙබරවාරි<br>2025 මාර්තු - ජූනි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | GIS ඒකකයේ මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.<br>a) GIS විෂය භාර ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් සඳහා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) මූලිකාංග, ගෝලීය ස්ථානගත පද්ධතිය (GPS), දත්ත ගොනු සැකසීම, GIS මෘදුකාංග පුහුණුව, සිතියම් නිර්මාණය වැනි විෂය කරුණු ඇතුළත් මාර්ගගත දේශන මාලාවක් GIS ඒකකය භාර නිලධාරි විසින් පැවැත්වීම.<br>b) සීගිරිය පුරාවිද්‍යාත්මක පරිශ්‍රයෙහි පැවැත්වීමට අපේක්ෂිත පුහුණු වැඩමුළුව<br>c) ඉහත සියළු කාර්ය පහසුව හා කාර්යකෂමතාව සඳහා GIS ඒකකයට තවත් නිලධාරියෙකු ලබා ගැනීම | 10<br>නිලධාරින් 20ක් සඳහා<br>01 | GIS ඒකකය භාර නිලධාරි<br>"<br>" | සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ)<br>"<br>සහකාර අධ්‍යක්ෂ (නිශ්චල දේපළ) පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | 2025 මාර්තු - දෙසැම්බර්<br>2025 ජූනි - ජූලි<br>2025 මාර්තු සිට |

### විශේෂ කරුණු

- ඉහත 03. i කොටසට අදාළව පුරාස්ථාන ප්‍රමාණය 75ක් ලෙස දක්වා තිබුණ ද එම ප්‍රමාණයෙහි යම් වෙනසක් සිදුවිය හැකිය.
- මෙම කාර්ය සැලසුම සියළු ම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල වෙත යැවිය යුතු අතර ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් විසින් තම කාර්යාලයේ GIS විෂය භාර නිලධාරියා විධිමත්ව දැනුවත් කොට වගකීම් පැවරිය යුතුවේ.

ඇමුණුම 03

## 2024 කැණීම් ව්‍යාපෘති විස්තර ඇතුලත් දත්ත ගොනුවෙන් උපුටාගත් සංක්ෂිප්ත සටහන

| අ.අ | කැණීම සිදුකරන ස්ථානයේ නම | කැණීම් මගින් සිදුකරන ලද සොයාගැනීම් | කැණීම් කාර්යය සාර්ථක/ අසාර්ථක බව | තව දුරටත් ඉදිරියට කැණීම් කළ යුතු ද |
|---|---|---|---|---|
| 01 | නාගදීප පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රතිමා ගෘහය කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. අදාළ ප්‍රතිමා ගෘහයට අදාළ සාධක අණාවරණය කර ඇත. සංරක්ෂණයට යොමුකර ඇත. |
| 02 | ඕවාගිරිය රජමහාවිහාරයේ නටඹුන් ස්තුප ගොඩැල්ල පදා ගැනීමේ කැණීම් ව්‍යාපෘතිය. | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. පැරණි ස්තුපය අණාවරණය කර සංරක්ෂණයට යොමුකර ඇත. |
| 03 | දීගවාපිය ඕලුවිල් මාර්ගයේ ගංවතුරට සේදී යාමෙන් මතුවු ගල් ඇතිරුමේ පර්යේෂණ කැණීම. | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. අදාළ සියලු තොරිුරු වාර්තා කොට ආරක්ෂිතව නැවත වසා දමන ලදි. |
| 04 | බණ්ඩාරවෙල පල්ලිය කන්ද ප්‍රාග් ඓතිහාසික භූමිය ගලවා ගැනීමේ කැණීම් ව්‍යාපෘතිය. | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. සංවර්ධන කාර්යය නිදහස් කිරීමට යෝජිත භූමිය හඳුනාගෙන එම භූමිය නිදහස් කිරීමට නිර්දේශ ලබාදී ඇත. |
| 05 | ඇරවුවල හානි ඇගයුම් කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. සීමිත පුරාවස්තු ප්‍රමාණයක් | සාර්ථකයි | ඔව්. නැවත කැණීම් කිහිපයක් යොදා සංවර්ධන කාර්යයට නිදහස් කිරීමට යෝජිත භූමිය පිළිබඳ අධ්‍යයන කිරීම. |
| 06 | දීගවාපිය ස්තුප මලුව කැණීම (අදියර I ) 2024 | මෙම කැණීම අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ. අවසන් වාර්තාවට පුරාවස්තු ලේඛනය එක්කරනු ඇත. | සාර්ථකයි | ඔව්. ස්තුපය සංරක්ෂණයට සමගාමීව මලුව පදා ගැනීම සඳහා කැණීම් කළ යුතුය. |
| 07 | කොළඹ වරාය බැටන් බර්ග් කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. කැණීමේ තොරතුරු අනුව මාර්ගය ඉදිකිරීමට අදාළ භූමිය නිදස් කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත. |
| 08 | වනාතවිල්ලුව අශා මිනරල් ඛනිජ නිස්සාරණ වැඩබිමේ පර්යේෂණ කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට නැත. | සාර්ථකයි | නැත. කැණීමේ තොරතුරු අනුව වැඩබිමට අදාළ භූමිය නිදස් කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 09 | පොදු වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම සඳහා හානි ඇගයුම් කැණීම - ගාලු කොටුව | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. කැණීමේ තොරතුරු අනුව වැසිකිලි පද්ධතිය ඉදිකිරීමට අදාළ භූමිය නිදස් කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත. |
| 10 | සීතාවක රාජසිංහ මාලිගාව පිහිටි භූමියේ ඇති ඕලන්ද කොටුව කැණීම | අවසන් කැණීම් වර්තාවට එක් කරනු ඇත. | සාර්ථකයි | ඔව්. බලකොටුව සංරක්ෂණය සඳහා කැණීම ව්‍යාප්ත කර යුතුය. කැණීම් කල කොටස ආරක්විතව සංරක්ෂණය සඳහා යොමුකර ඇත. |
| 11 | මඩුවන්වෙල දෙදරන්ගමුව කැණීම | අවසන් කැණීම් වර්තාවට එක් කරනු ඇත. | සාර්ථකයි | නැත. පැරණි ස්තූපය අණාවරණය කර සංරක්ෂණයට යොමුකර ඇත. |
| 12 | පුංචි හල්මිල්ලෑව කිරිමැටියාව ස්ථානයේ අධිකරණ නියෝග මත සිදුකරණ ලද කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. අධිකරණ නියේගය අනුව මහජනතා අවශ්‍යතාවය මත කැණීම් කිරීම. |
| 13 | ආලංකුලම පර්යේෂණ කැණීම | අවසන් කැණීම් වර්තාවට එක් කරනු ඇත. | සාර්ථකයි | ඔව්. පර්යේෂණ අවශ්‍යතාවය මත නැවත මෙම ප්‍රදේශයේ කැණීම් කළ යුතුය. |
| 14 | වෙස්සගිරිය පුරාවිද්‍යා ස්ථානයේ ස්තුප කැණීම | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. පැරණි ස්තූපය අණාවරණය කර සංරක්ෂණයට යොමුකර ඇත. |
| 15 | කලාප කාර්යාලය ඉදිකිරීමට යෝජිත භූමියේ පර්යේෂණ කැණීම. | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. සීමිත පුරාවස්තු ප්‍රමාණයක් | සාර්ථකයි | නැත. කැණීම් අවසානයේ සංවර්ධන කාර්යයට අදාළ භූමිය තිරණය කොට නිදහස් කිරීමට යෝජනා කිරීම. |
| 16 | රොක්හිල් වත්ත පෞද්ගලික ඉඩමේ හානි ඇගයුම් කැණීම. | අවසන් කැණීම් වර්තාවට එක් කරනු ඇත. | සාර්ථකයි | නැත. කැණීම් අවසානයේ සංවර්ධන කාර්යයට අදාළ භූමිය තිරණය කොට නිදහස් කිරීමට යෝජනා කිරීම. |
| 17 | ඇතුල් කොට්ටේ හානි ඇගයුම් කැණීම් ව්‍යාපෘතිය | අවසන් කැණීම් වර්තාවේ වාර්තා කොට ඇත. | සාර්ථකයි | නැත. කැණීම් අවසානයේ සංවර්ධන කාර්යයට අදාළ භූමිය තිරණය කිරීම. |

ඇමුණුම **04**

**සංරක්ෂණ සැලැස්ම- අත්තනගල්ල පාරුව ප්‍රතිෂ්ඨාපනය**

| අදියර | කාර්යය | වගකීම | කාලරාමුව |
|---|---|---|---|
| 01 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන රසායනාගාරය වෙත රැගෙන ඒම සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගැනීම. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | කාර්යය අවසන්ය. |
| 02 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සිට පාරුවේ කොටස් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන රසායනාගාරය වෙත රැගෙන ඒම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | කාර්යය අවසන්ය. |
| 03 | කමිටු තීරණයට අනුව පුරාවස්තුව අනුරූ පාසලේ නිෂ්පාදන කණ්ඩායම් නායක ගාමිණී ජයසිංහ මහතාගේ නිරීක්ෂණයට ලක්වීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | කාර්යය අවසන්ය. |
| 04 | අනුරුව තැනීම සඳහා අවශ්‍ය පුරාවස්තුවේ පරිමාණුකූල සැලැස්ම ලබාදීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | කාර්යය අවසන්ය. |
| 05 | පුරාවස්තුව සමස්තයක් ලෙස සංරක්ෂණ සීමා ඉක්මවා ගියද අරටුව සහිත ශක්තිමත් කොටස් තහවුරුකාරයක් යොදා කිරීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | කාර්යය අවසන්ය. |
| 06 | අනුරුව තැන්පත් කිරීමට තාවකාලික පුරගෙයක් ( අඩි 15 ක් පමණ දිග) නිර්මාණය කිරීම | මධ්‍යම සංස්කෘතික අරමුදල ජාතික අනුරූ පාසල | කාර්යය අවසන්ය. |
| 07 | අනුරුව නිර්මාණය කිරීම | ජාතික අනුරූ පාසල | වසරක් |
| 08 | පාරුවේ සංරක්ෂිත කොටස් ෆයිබර්ග්ලාස් සැකිල්ල මත ස්ථානගත කිරීම | ජාතික අනුරූ පාසල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | එම වසර තුළ |